# 12. මුල් කිතුනු සභාව

**ශුද්ධාත්මයාණන් වහන්සේගේ පිහිට ඇතුව ශක්තිමත් ව එක ම කණ්ඩායමක් හැටියට ආදර්ශවත් ව වැඩ කළ මුල් සභාවේ ශ්‍රාවකයින් ගත කළ ජීවිතය අපට වැදගත් වන ආකාරය මෙම පාඩමින් ඉගෙන ගැනීම අපේක්ෂිත ය.**

**ක්‍රියා 2 : 37 - 47**

'සභාව' යනුවෙන් හඳුන්වන විට අපේ කල්පනාවට එන්නේ දේවස්ථාන ගොඩනැගිල්ලකි. එය සභාවේ ඇදහිලිවතුන් රැස්වන ස්ථානයකි. සභාව යනු ශුද්ධාත්මයාණන්ගෙන් දිරිය ලබා ඇදහිල්ලෙන් හා දේව බයෙන් යුතුව සාක්ෂි දරන සමූහයකි.

මුල් සභාව ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් බිහිවුණි. පෙන්තකොස්ත දවසේ ශ්‍රාවකයන් ශුද්ධාත්ම දානය ලැබුවායින් පසු ඔවුන්ගේ ජීවිතවල විශේෂ වෙනස්කම් ඇති විණි. එදින පේදුරුතුමා කළ දේශනය අසා තුන්දහසක් පමණ දෙනා සභාවට එකතු වූහ. ඔවුහු පසුතැවිලි වී හිත් හරවා ගනිමින්, ජේසුස් වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලැබූහ.

මෙසේ දවසින් දවස වැඩි වූ කිතුනු සභාවේ, ඇදහිලිවතුන් අතර පොදුවේ පැවති ලක්ෂණ පිළිබඳව අපි දැන් ඉගෙන ගනිමු.

## මුල් සභාවේ ලක්ෂණ




මෙම ආකෘතියට අනුව අපට පැහැදිලි වන්නේ සභාව ගොඩ නැගී ඇත්තේ ජේසුස් වහන්සේ මත බව යි. සභාව පෝෂණය කරන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ ය.

## ඉගැන්වීම

ජුදෙව්වෝ ධර්ම ශාලාවල රැස්වෙමින් ශුද්ධ ලියවිලි ඉගෙන ගැනීමට පුරුදු පුහුණු වී සිටියහ. ඒ සඳහා ඔවුනට විනයධරයන්ගේ හා ධර්මශාලා නායකයින්ගේ සහාය ලැබුණි. පෙන්තකොස්ත දවසේ ශුද්ධාත්ම දානය ලැබූ ශ්‍රාවකයින් ඉගැන්වීමේ සේවයෙහි උනන්දුවෙන් නියැලුණි. ඔවුහු ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මරණය හා උත්ථානය ගැන සාක්ෂි දරමින් ඉගැන්වූහ.

## සහභාගීකම

මුල් ක්‍රිස්තියානි සභාව තුළ සියලු දෙනා ප්‍රේරිතවරුන්ගේ නායකත්වය යටතේ රැස්වුණාහ. ඔවුන්ට ලැබුණ ඉගැන්වීම් අනුව එක්සත්ව හා එක්සිත්ව අලුත් ජීවිතයකට හුරුපුරුදු වූහ. මෙය ඔවුන් අතර වර්ධනය වූ පොදු ජීවන රටාවකි.

## රොටි කැඩීම



මුල් සභාවේ, ප්‍රේරිතයන් හා ඇදහිලිවතුන් ගෙයින් ගෙට යමින් රොටි කැඩීමෙහි නියැලුණි. එසේම ප්‍රීතියෙන් හා ත්‍යාගිවන්ත සිතින් ආහාර එකිනෙකා අතර බෙදාගත්හ. මෙය ඔවුන්ගේ එකමුතුකම පෙන්වූ ලක්ෂණයකි.

මෙම රොටි කැඩීමේ අවස්ථාව පසු කාලයේ දී ශුද්ධ සහභාගීකමේ පිළිවෙත පැවැත්වීම සඳහා ද යොදා ගත් බව පෙනී යයි. (1 කොරින්ති 11:23-26)

## සියල්ල පොදුවේ තබා ගැනීම

මෙය මුල් කිතුනු සභාවට ම පමණක් සුවිශේෂී ලක්ෂණයකි. ක්‍රිස්තුන් වහන්සේ පිළිගත් ජුදෙව්වන් අතර පොහොසත් අය මෙන් ම දුප්පත් අය ද සිටියහ. මුල් සභාවේ ඇති වූ වෙනස්කම වූයේ ශුද්ධාත්ම බලය නිසා සෑම දෙනා ම තමුන්ට අයිතිව තිබුණ දේ විකුණා ඒවා ප්‍රේරිතවරුන් පාමුල තැබීම යි. මෙයින් එකිනෙකා අතර, ප්‍රේමය හා කිට්ටුවන්තකම වැඩි විය. මෙම අලුත් ජීවන ක්‍රමය නිසා කිසි කෙනෙකුට අගහිඟකමක් නොවී ය.

## යාච්ඤාව

මුල් කිතුනු සභාවේ තිබුණ වැදගත් ම ලක්ෂණය යාච්ඤාව යි. ජුදෙව්වරු ඔවුන්ගේ චාරිත්‍රවලට අනුව, නියමිත වේලාවන්හි යාච්ඤා කළ බව පෙනේ. (ක්‍රියා 3 : 1) එහෙත් මුල් කිතුනු සභාව පටන් ගත් දා සිට, චාරිත්‍රයක් ලෙස නොව නිතර ම යාච්ඤාවට එකතු වූහ. මෙයින් යාච්ඤාව සඳහා ඉතා උනන්දු වූ සමූහයක් මෙහි සිටි බව පෙනේ.

අප කතා කළ මෙම ලක්ෂණ මූලික කරගෙන ඇති වූ මුල් කිතුනු සභාව ඉතා ඉක්මනින් වැඩී වර්ධනය විය. එවිට සභාව තුළ පහත ලකුණු දකින්නට ලැබුණි.

- සැමදෙනා තුළ දේව ගරු බිය ඇති වීම.
- ප්‍රේරිතවරුන් අතින් බොහෝ අරුම පුදුම දේ සිදු වීම.
- ගැලවීම ලබන්නන්ගේ ගණන දවසින් දවස වැඩි වීම.

## මුල් සභාවෙන් අපගේ ජීවිතවලට ආදර්ශයන්

කිතුනු දරුවන් ලෙස අප, දෙවියන් වහන්සේට දවසින් දවස ළං වී ජීවත් වීම අවශ්‍ය ය. එසේ ළං විය හැක්කේ යාච්ඤාවෙන් හා දේව වචනය ගැන දැන ගැනීමෙනි. එසේම කිතුනු ආගම තනියම අදහන එකක් නොවේ. එය සැමවිට ම දේව පවුලක් ලෙසට එකමුතුව අත්දකින ඇදහිල්ලකි. මෙය සභාවක් ලෙස වර්ධනය වනවා දැකීම දෙවියන් වහන්සේගේ බලාපොරොත්තු යි.

අප කිතුනු නමස්කාරය චාරිත්‍රයට හෝ පුරුද්දට පමණක් නො කළ යුතු ය. අපි නමස්කාර කරන සභාව තුළ උනන්දුවෙන් හා කැපවීමෙන් එහි යෙදෙන්නට හැමවිට ම උත්සාහ කරමු. මුල් සභාව ශුද්ධාත්ම ආලේපය ලබා එකමුතුව කල් යවමින්, නමස්කාරයේ නියැලීම අපට මහත් ආදර්ශයකි. එකමුතුව නමස්කාර කරන සභාවක දී ශුද්ධාත්මයාණන් වහන්සේ බලවත් ලෙස ක්‍රියා කරන සේක.

එසේ ම එකිනෙකාට උදව් කරමින්, නැතිබැරි අයට පිහිට වෙමින්, සභාව තුළත් සමාජය තුළත් ශක්තිමත් කිතුනු ජීවිතයක් ගත කරමු.

### ක්‍රියාකාරකම

1. මුල් කිතුනු සභාවේ පැවති ලක්ෂණ ලියන්න.
2. නමස්කාරය සඳහා රැස්වීමේ වැදගත්කම ලියන්න.